5 වන පිටෙන්

භූමියෙන් ඉතා විශාල චීනය දීර්ඝ කාලයක් ප්‍රමාණයෙන් කුඩා ජපානයෙන් බැට කෑවේය.

ජාතියක් ලෙස සිංහල බෞද්ධයා අද ඉතා ව්‍යාකූල තත්ත්වයකට පත්ව සිටියි.

ඉන්දියානු ආක්‍රමණිකයෙක් ලෙස මහාවංශය හඳුන්වා දෙන එළාර රජු පැරදූ වූ දුටුගැමුණු රජු පිළිබඳව මහාවංශය කරන වර්ණනාව සිංහල බෞද්ධයාට ඉතා ඉහළ චිත්ත සංතෘප්තියක් ගෙන දෙයි. එහෙත් එම ග්‍රන්ථයම සියවස් කිහිපයකට පෙර ඉන්දියාවෙන් පැමිණි සහාසික කුමාරයකු ගෙන් සිංහල ජාතිය පැවත එන බව පවසයි. ඊට ටික කාලෙකට පසු ඉන්දියාවේ රජෙකු ලංකාවට බුදු දහම අපනයනය කළ බව මහාවංශය නැවතත් සඳහන් කරයි. තව කලකින්, බෞද්ධයාගේ මහානර්ඝ පූජනීය වස්තූන් වන ශ්‍රී මහා බෝධියද දන්ත ධාතුවද ඉන්දීය කුමර කුමරියන් විසින් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට වැඩම කරවූ බව මහාවංශය කියයි. දුටුගැමුණු, වලගම්බා වැනි ඉන්දීය ආක්‍රමණිකයන්ට එරෙහි වූ රජුන් පිළිබඳව මහත්සේ වනන මහාවංශයම මේ ඉන්දියානු පරිත්‍යාග ගැනද සඳහන් කිරීම සියලූ දේ ව්‍යාකූල කරයි.

විශේෂයෙන්ම ඉන්දියාවෙන් කෙනෙහිළිකම් කෙරෙන විට මේ ඉන්දියන් සම්බන්ධතා අපට මහත් චිත්ත පීඩාවක් ගෙනදෙයි. අප රාමායණය හරහා හඳුනාගත් රාවණා සොයා යන්නේ එවිටයි. අපට බෞද්ධකමද හැරදැමිය නොහැක. එබැවින් පන්සලේ පුදන්නට මල් කඩාගෙන ඒම සඳහා කොහේදී හෝ හමුවන හුණුගල් උමගක් දිගේ රාවණාව පිටත් කර යවයි. දැන් නැවතත් අවුල් සහගත තත්ත්වයකි. සාහිත්‍ය මූලාශ්‍ර සත්‍ය යෑයි පිළිගතහොත් රාවණා රජුගේ කාලය අද පටන් වසර හය හත් දහසක් පිටුපසට යයි. එහෙත් බුදුන් වැඩ සිටියේ මෙයට වසර දෙදහස් පන්සියකට පෙරය. මේ අවුලෙන් මිදීම සඳහා රාවණාට බණ කිව්වේ කාශ්‍යප බුදුන් යෑයි තවත් මතයක් ගොඩනඟයි. එහෙත් බුදු දහමට අනුව බුදුවරුන් දෙදෙනෙකු අතර කාල පරතරය ඉතා විශාලය. එය අඩුම වශයෙන් වසර ලක්ෂ ගණනක් බව ලකල්පල සංකල්පය තුළින් හෙළිවේ. මේ අනුව දැන් අපි ගණිත ගැටලූවකටද මුහුණ පා සිටිමු.

මේ වන විට ලංකාවේ බොහෝ මාධ්‍යවලට ඊටම ආවේනික වූ රාවණා පිළිබඳ මඟ පෙන්නන්නෙකු හෝ කිහිප දෙනෙකු සිටිති. මෙය ලොව කොතැනත් මාධ්‍යයේ ස්වභාවයයි. ඔවුන් ජනතාවට ලබා දෙන්නේ ජනතාව ඉල්ලන දෙයයි. මීට වසර පනහකට පමණ පෙර, මළගිය ආත්මයක් වැහුණු පුද්ගලයෙකු හා ඇතිවූ කතා බහක් ආශ්‍රයෙන් මාර්කස් ප්‍රනාන්දු නම් මහතෙක් කොග්ගල නිලමේ නමින් ග්‍රන්ථයක් ප්‍රකාශනයට පත් කර තිබුණි. මෙහි සඳහන් වූයේ රාවණා රජු දවස සිට භූත ආත්ම බවට පත්වූ කිහිප දෙනෙකු භූතාවේශ වූ පුද්ගලයා හරහා එම යුගය පිළිබඳව පවසන කාරණාය. මීට වසර දෙකකට පමණ පෙර මේ පොතේ මෘදු කොපියක් අන්තර්ජාලයේ සංසරණය වන්න විය. අද මාධ්‍ය හරහා නොයෙකුත් බලවේගයන්ගෙන් දැනගත්තා කියමින් රාවණා රජුගේ දේවල් පිළිබඳව කරන විස්තර හැම එකක්ම පාහේ මේ කොග්ගල නිලමේ ග්‍රන්ථයෙන් උපුටාගෙන අතින් කෑලි එකතු කළ කතාන්දරය.

මෙහිදී මා දකින සංවේගාත්මක කාරණයක් නම් මා ඉතා අගය කරන පුරා විද්‍යාඥයකු වන මහාචාර්ය රාජ් සෝමදේව මහතා මුහුණ දී ඇති තත්ත්වයයි. වසර ගණනාවක් වෙහෙසී පරීක්ෂණ සිදු කර එතුමා යම් පූර්ව ඓතිහාසික සාධක සොයාගත් විට, එතුමාටත් පෙර රූපවාහිනී තිරය ඉදිරියට පනින සමහර පණ්ඩිතයෝ ඒ හැම දෙයක්ම රාවණාකරණය කරති. ස්වභාවික උමං තුළින් ගමන් කළ විට හමුවන විශාල ගල් ගුහා සහ ඒවා තුළ පවතින ගංගා, පොකුණු, දියඇලි ලෝකයේ බොහෝ රටවල හමුවී ඇත. එහෙත් ලංකාවේ උමගක් තුළ ඇති දිය කඩිත්තක් හමු වූ විට, එය සීතාට ස්නානය කිරීමට රාවණා තැනූ ජල තටාකයකි. පෞරාණික වැසිකිළියක් හමුවුණොත් එය රාවණා හෝ ඔහුගේ බිසවුන් පාවිච්චි කළ ස්ථානයකි.

අපට බුදු දහම අවැසිය. එහෙත් බුදුරදුන් ඉන්දියානුවකු වීම ඉවසිය නොහැකිය. බුදුරජාණන් වහන්සේගේ උප්පැන්න සහතිකය වෙනස් කිරීමට උත්සාහය පැමිණෙන්නේ මෙතනදීය.

බුදුරදුන් ඉපදුන ස්ථානය පිළිබඳව නිරීක්ෂණ, ගවේෂණ, පර්යේෂණ ආදිය කිරීමට ඕනෑම කෙනෙකුට අයිතියක් ඇත. එහෙත් එබඳු කර්තව්‍යයක් කිරීමේ පිළිගත් ක්‍රමවේදයක් ඇත. ඉන්පසු එහි නිගමන ප්‍රකාශ කිරීමේදීද අද්‍යාත්මික සංයමයක් මෙන්ම තමාගේ නිගමන පිළිබඳව මතුවන අභියෝගවලට සතුටින් සහ සාර්ථකව මුහුණ දීමට හැකියාවක් ද තිබිය යුතුය. එහෙත් මේ කාරණය සම්බන්ධයෙන් මෑතක සිට පළවන බොහෝ ලිපි ලේඛන මෙන්ම වාචික ඉදිරිපත් කිරීම්වලද මේ බොහෝ අංග නොමැතිය. ඒ වෙනුවට ඇත්තේ ක්‍රෝධයක සේයා සටහන් වන ප්‍රලාප දෙඩීමකි.

බුදු දහම පැතිරුණ ප්‍රදේශ (දැනට පවතින සහ වියැකී ගිය) දෙස බලන විට එම දහමෙහි උපත උතුරු හෝ ගිනිකොනදිග ඉන්දියාවේ කේන්ද්‍ර ගතවී ඇති බව පහසුවෙන් වටහා ගත හැක. එමෙන්ම බුදු දහම එම ප්‍රදේශයේ සිට පැමිණි බව සහශ්‍ර දෙකකට ආසන්න කාලයක සිට (හෝ ඉන් මෙපිට) ලෝකයේ බොහෝ රටවල විශ්වාසය වී ඇත. ඒ පිළිබඳව ලිඛිත සහ භෞතික සාක්ෂි මෙන්ම ජන කතාද පවතී. ටිබ්බතය, භූතානය, මොන්ගෝලියාව වැනි මෙම විශ්වාසය තිබෙන සමහර රටවල් ඉතා මෑතක් වනතුරු බටහිරයන්ගේ පාදස්පර්ශය හෝ ලබා නොතිබුණි. මේ අනුව සුද්දෙකු ලිවූ ලේඛනයක ලංකාවට දඹදිව කියා සඳහන් කර තිබීම වැනි කරුණකින් හෝ වෙනත් ඉතා දුර්වල තර්ක මඟින් සියවසක පමණ කාලයකදී සුද්දන් විසින්ම බුදුරදුන්ගේ ජන්ම ස්ථානය වෙනස් කළා යෑයි පැවසීම පිළිබඳව අප තව වතාවක් කල්පනා කළ යුතුය.

මා දන්නා ආකාරයට නම්, බුදු දහම යනු විශ්වයේ පැවැත්ම සහ ගලා යැම පිළිබඳ න්‍යායන් විස් තර කෙරෙන දැනුම් සම්භාරයකි. ගුරුත්වය, ඒ පිළිබඳව අදහස් මුලින්ම ඉදිරිපත් කළ අයිසැක් නිව්ටන් ගෙන් ස්වායත්ත වේ. නිව්ටන් කුමන රටක ඉපදුනත්, කිසිදාක නොඉපදුනත්, ගුරුත්වය ක්‍රියා කරන න්‍යායන් වෙනස් නොවේ. මා බුදු දහම දකින්නේද මේ ආකාරයටයි. බුදු රදුන්ගේ ජීවිත රටාවෙන් අපට ගත හැකි අනෙක ආදර්ශයන් හැරුණු කොට, ධර්ම කාරණාවල සංයුතියට එතුමාගේ පැවැත්ම කිසිසේත් අදාළ නොවේ. මේ අනුව බුදු රදුන් ඉපදුනේ කුමන රටේද යන්නවත්, එවැනි භෞතිකමය පුද්ගලභාවයක් කිසිදා නොතිබුණාද යන්නවත් ධර්මතාවයන්ගේ පැවැත්මට අදාළ නොවේ.

තම රට දැඩි පීඩනයකට පත් කළ ජපානය සහ බ්‍රිතාන්‍යය පිළිබඳව චීනාටත්, මැලේසියාව පිළිබඳව සිංගප්පූරු ජාතිකයාටත්, ඇමරිකාව පිළිබඳව කියුබානුවාටත්, එංගලන්තය පිළිබඳව අමරිකානුවාටත් ඇත්තේ තදබල විරෝධයකි. සමහර අකටයුතුකම් සිදුවී සියවස් කිහිපයක් ගතවී ඇතත් මේ ජාතිකයන් තුළ ශේෂවී ඇති විරෝධයේ මාත්‍රා මම අදද ඔවුන් කෙරෙන් දකිමි. එම රටවල නායකයෝ මෙම ජන හදවත් කළඹන විරෝධී ආකල්ප ධනාත්මක ලෙස රටේ සංවර්ධනයට යොදාගත්හ. ඔවුන් තුළ පීඩකයා අභිබවා යැමේ යම් චේතනාවන් තිබුණු අතර එය සිදු වූයේ වඩාත් සෞභාග්‍යමත් ජාතියක් ගොඩනැඟීම ඉලක් ක කරගෙනය. එහි ප්‍රතිඵල අද ඔබට එම රටවල් දෙස බලන විට පෙනෙනවා ඇත.

එහෙත් අවාසනාවකට ශ්‍රී ලංකාව, පකිස් තානය, නේපාලය, සිම්බාබ්වේ ආදී රාජ්‍යයන් තුළ මෙම අසල්වැසියාට හෝ පීඩකයාට එරෙහි විරෝධය යොදා ගැනුනේ දේශපාලකයාගේ පැවැත්ම උදෙසාය. මෙහි විපාකද ඔබ අදටත් අත්දකිමින් සිටියි. අපගේ ඉන්දියන් විරෝධය ඇත්තේ බෝඩ් කෑලි සහ බැනර්, උද්ඝෝෂණ, දේශපාලන වාද විවාද, පොල් ගැසීම්, මල්වඩම් තැබීම් සහ මෑත කාලයේදී වතපොතේ පලකරන පින්තූර සහ කොමෙන්ටු මෙන්ම වාහන ස්ටිකර් වැනි දේ තුළය.

මේ සියලූ විප්‍රකාර කිරීමෙන් අනතුරුව නිවස බලා යන ලාංකිකයා රූපවාහිනී තිරය ඉදිරිපසට වී සියලූ ඉන්දියන් විරෝධී කටයුතු පසෙක තබා ඉන්දියන් නළු නිළියන්ගේ දුක්ඛ දෝමනස් ස කරදර කම්කටොලූ තමාගේ කර ගනී. ටෙලි නාටකවලින් පසුවද නින්දට යනතෙක් ඔවුන් කතා කරන්නේ ඉන්දියන් නළු නිළි චරිතවලට හෙට දිනයේ කුමක් සිදු වේද කියාය. පසුදා අවදිවන ඔවුන් නැවතත් වතපොතේ, පාර දිගේ තම ඉන්දීය විරෝධය පුම්බාලයි. නමුත් ඒ සියල්ල කරන්නේ ඉන්දියන් වෙළෙඳ ජාලයේම කිමිදීගෙනය.

උදෑසන අවදි වූ අවස්ථාවේ සිට අප වැඩිපුරම භාවිතා කරන්නේ ඉන්දියන් නිෂ්පාදනය. දත් බුරුසුවේ සිට, අඳින සාරිය, ගමන් කරන ලංගම බස් රථය, පාරේදී හමුවන බොහෝ වාහන, කෑම බිම වර්ග, බෙහෙත් වර්ග ආදී මෙකී නොකී බොහෝ දෙය පැමිණෙන්නේ ඉන්දියාවෙනි.

මෙයින් ඉතාම අවාසනාවන්ත සංසිද්ධිය සාරියයි. ලාංකික කාන්තාවගේ අනන්‍යතාවය බඳු මේ වත පළඳනාව දැන් දශක ගණනාවක සිට රජයේ මෙන්ම සමහර පෞද්ගලික ආයතනවලද අනිවාර්ය කාන්තා ඇඳුම බවට පත්ව තිබේ. මඟුලට, මරණයට, පිරිත් පිංකමට මෙන්ම පාසලට දරුවා ඇරලීමටද දැන් බොහෝ තැන්වල කාන්තාව සාරිය ඇඳීම අනිවාර්ය වී ඇත. නමුත් අපි එකද සාරියක් වත් මෙරට නිෂ්පාදනය කරනවාද? බංග්ලාදේශයෙන් සහ වෙනත් රටවල් කිහිපයකින් ගෙන්වන ඉතා සුළු ප්‍රමාණයක් හැර ලංකාවට ගෙන්වන සියලූම සාරි පැමිණෙන්නේ ඉන්දියාවෙනි. මට මතක ඇති කාලයක, ලංකාවේ සාරියක් නිපද වුනා නම් ඒ 70 - 77 සමයේ දීය. ඒවායින්ද බොහොමයක් එවකට භූමිතෙල් ප්‍රින්ට් යෑයි අපේ කාන්තාවන් පැවසූ ඉතා බාල වර්ගයේ සාරි පමණි. අපි මෙවන් රටක ජීවත් වෙමින් ඉන්දීය විරෝධී වීම හාස්‍යයට කරුණක් නොවේද?

ඉන්දියාවෙන් ගෙන්වන බජාජ් රථයේ පිටුපස සිංහ ලේ කියා ගසාගෙන ගියාට රටක් දියුණුවන්නේ වත් ඉන්දියාවට දැනෙන්නේවත් නැත.

අපට ඉන්දියාව පමණක් නොව ලෝකයම ඉදිරියේ අභිමානයෙන් නැගී සිටීමට නම් අපගේ ඉන්දියන් හෝ අධිරාජ්‍ය විරෝධී හැඟීම් නාභිගත කළ යුත්තේ රටේ සෞභාග්‍යය උදෙසාය. දේශපාළුවගේ වුවමනා එපාකම් වෙනුවෙන් කෑගසමින් ඔබ කා දමන කාලයත්, ශක්තියත්, ආත්ම විශ්වාසයත්, චෛතසික සංයමයත් ඉතිරි කරගෙන එය තමාගේ ජීවන අභිවෘද්ධියට යොදා ගන්නේ නම් රටක් ලෙස අප සියලූ දෙනාටම අභිමානයෙන් නැගී සිටිය හැක. ජාතියක් ලෙස නැගී සිටීම අප ඇරඹිය යුත්තේ ස්ව අභිවෘද්ධිය තුළිනි. එය කවුරුන් හෝ ලබා දෙනකම් බලා සිටිය යුත්තක් නොවේ.

තව බොහෝ දේ ලියන්න සිතුනත් කාල වෙලාව ඊට එරෙහිවේ. එබැවින් බුදුන්ගේ ශ්‍රී ලංකා උත්පත්තිය පිළිබඳ තරයේ අදහන මගේ කිට්ටු මිතුරෙකුගේ අදහසකට මා පළකළ මතය ඉදිරිපත් කරමින් නවතිමි.

ඔහු පැවසුවේ බුදුන්ගේ උපන් දේශය ලංකාව යෑයි සනාථ කරගත හොත් විශාල සංචාරකයන් පිරිසක් ලංකාවට ගෙන්වා ගත හැකි බවයි. නමුත් මා දකින්නේ මේ සඳහා ඉතා දීර්ඝ කාලයක් පර්යේෂණ කළයුතු බවයි. ඉන් පසු මෙය සත්‍ය යයි ඔප්පු කළත් එය වෙනත් රටවල සිටින බෞද්ධ බැතිමතුන්ට කා වැද්දීමට තවත් ශතක කිහිපයක් ගතවිය හැකිය.

අනෙක් අතට ඔබ පොඩ්ඩක් හිතන්න. මීට වඩා බොහෝ පහසුවෙන් මේ වන විට රටේ සෑදී ඇති රාවණා උමතුවෙන් අපිට විදේශ විනිමය ඇදිය හැක. ලොව පුරා කෝටි ගණනක් හින්දු බැතිමතුන් සිටිති. ඔවුන්ට නැරඹීමට රාමා මෙරටට පැමිණ නොයෙකුත් දේවල් කළ ස්ථාන, සීතා නිදාගත් තැන, ස්නානය කළ පොකුණ, ඇයට හනුමන්තා හමුවූ තැන, රාම කුමරු හමු වූ තැන, හනුමන්තා ගිනි තැබූ ස්ථාන ආදී මෙකී නොකී තැන් සිය ගණනක් අපට ලංකාව තුළ අර්ථ දැක් විය හැක. ඔබට කළ යුතුව ඇත්තේ අදාළ ස්ථානවල කෝවිල් සාදා ඒ තුළ පිළිම කිහිපයක් තැබීම පමණි. ඉන්දියානුවෝ ඒවා රනින් පුරවනු ඇත.

දිවයින

## සන්නස Cartoon by PK

